

# හාවාට පාඩමක්



කතාව හා චිත්‍ර ඉඳුතරා අප්සරි



# හාවාට පාඩමක්

කතාව හා චිත්‍ර - ඉඳුතරා අප්සාරි

ISBN 978-624-208-017-8

# පිදුම

කියවීමට කැමති
මාගේ දයාබර
යහළු යෙහෙළියන්ට
මේ පොත
සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙනලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කරගෙන ග්‍රන්ථ කරණයට යොමු වූ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසලතුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජිවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හා එක්වූ පුංචි ලේඛක,ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමව්පියන්, ආදී ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්,ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උපකාර කල සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2023.10.20




එක කාලෙක ලස්සන
කැලේක හාවෙක් සිටියා.

ඒ හාවා හරිම නපුරුයි.

ඒ වගේම අකීකරුයි,
දඟකාරයි.

එයාට යාළුවෝ හිටියේ නෑ.
කැලේ යාළුවෝ හාවාට
කැමතිත් නෑ.







දවසක් හා පැංචා අම්මත්
එක්ක තරහ වෙලා ගෙදරින්
එළියට ගියා.

පාර දිගේ ඈතටම ගියා.

ටික දුරක් ගිය හා පැංචාට බයක් දැනුණා.

ආපසු යන්න ඕනේ කියලා හිතුනත් පාර හොයාගන්න බැරි වුණා.





හා පැංචා ගලක් උඩ
වාඩි වුණා.

අම්මව
මතක් වුණා.

එයාට ගොඩක්
දුක හිතුණා.


ඒක දැක්ක කුරුලු යාළුවා
එතැනට ආවා.

"මොකද මොකද අඬන්නේ.? "
කුරුලු යාළුවා ඇසුවා.

“මම අතරමං වූණා. ඒකයි මං
අඬන්නේ.”

හා පැංචා කිව්වා.





"අඬන්න එපා. මට පුළුවන් උදව් කරන්න.

මම පියාඹන නිසා මුළු කැලේම පෙනෙනවා.

මට පුළුවන් ඔයාගේ ගෙදර හොයාගන්න."

හා පැංචට ලැප්ජාවක් දැනුණා.කුරුලු යාළුවාගේ උදව්වෙන් අන්තිමේදී ගෙදර ගියා. හා පැංචා කුරුලු යාළුවට  ස්තුතියි කිව්වා.



හා පැංචා දැකපු අම්මාටයි
තාත්තාටයි ගොඩක් සතුටුයි.

ආපහු කවදාවත් නපුරු දඟ
වැඩ නොකර ඉන්න එයා
පොරොන්දු වුණා.



## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි.ඒ අතරින් වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘතීන් රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම, ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්වූ විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20